"Explore, Discover, Preserve: Join the Journey"

URSARU 2024

9th Undergraduate's Research Symposium on Archaeology
Rajarata University of Sri Lanka

**පර්යේෂණමය විස්තෘත සාරාංශ පත්‍රිකා කැඳවීම**

**පුරාවිද්‍යාව පිළිබඳ ශිෂ්‍ය විද්‍යාර්ථීන්ගේ නවවැනි පර්යේෂණ සමුළුව - 2024**

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ**

**(විස්තෘත සාරාංශ පත්‍රිකා සකස් කිරීම පිළිබඳ පොදු නියමයන්)**

### 01. මාතෘකාව (Topic)

- සිංහලෙන් නම් FMAbhaya අක්ෂරයෙන් 14 ප්‍රමාණයෙනි. Bold කළ යුතුය.
- ඉංග්‍රීසියෙන් සකස් කරන්නේ නම් Times New Roman අක්ෂරයෙන් 13 ප්‍රමාණයෙනි.

### 02. කර්තෘ නාමය.

- සිංහලෙන් නම් FMAbaya අක්ෂරයෙන් 11 ප්‍රමාණයෙනි.
- ඉංග්‍රීසියෙන් නම් Times New Roman අක්ෂරයෙන් 10 ප්‍රමාණයෙනි.
- කර්තෘ නාමය දැක්වීමේ දී මාතෘකාවට පහළින් පහත පරිදි යොදන්න.
- සෑම අවස්ථාවකදීම ශිෂ්‍ය විද්‍යාර්ථයා ප්‍රථම කතුවරයා වේ.
- එක් කර්තෘ වරයෙක් පමණක් නම් - ඒ.එච් කරුණාරත්න
- කර්තෘවරුන් කිහිප දෙනෙක් නම් - ඒ.එච් කරුණාරත්න , ඊ.එම් රණසිංහ , ජී.එච් මධුසංක
- කතෘවරුන් කිහිප දෙනෙක් සිටීනම් ප්‍රථම කතුවරයාගේ නම සෑම විටම මුලට යෙදිය යුතු වේ.
- විෂයානුබද්ධ උපදේශක ආචාර්යවරයා සම කතෘත්වය දරයි නම්, එම ආචාර්යවරයා සම කතෘත්වය දරයි. සෙසු කර්තෘවරුන් පිළිබඳ සඳහන් කළ යුතුය.

### 03. පාදක සටහන් යොදන විට.

ඒ.එච් කරුණාරත්න

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

karunarathna27@gmail.com

### 04. හැඳින්වීම (Introduction)

පර්යේෂණය පිළිබඳ ඉතා පැහැදිලි හා සංක්ෂිප්ත හැඳින්වීමක් සිදුකිරීම බලාපොරොත්තු වේ. පර්යේෂණයට අදාළ අරමුණු, පර්යේෂණ ගැටළුව, ආදිය පිළිබඳව පැහැදිලි කරන්නේ ද හැඳින්වීම තුළ දී ය.

### 05. ක්‍රමවේදය (Methodology)

පර්යේෂණය සිදු කිරීමේ ක්‍රමවේදය මෙහිදී විස්තර කළ යුතුය. පර්යේෂණ අරමුණු සහ පර්යේෂණ ගැටලුවට අනුව දත්ත එක් රැස් කර ගැනීමේ සහ දත්ත විශ්ලේෂණය කිරීමේ උපක්‍රම පිළිබඳවත්, සමස්ත පර්යේෂණය දියත් කළ ආකාරය පිළිබඳවත්, පර්යේෂණ සීමා පිළිබඳවත් අවධානය යොමු කරමින් මෙම ක්‍රමවේදය සකස් කළ යුතු වේ.

### 06. ප්‍රතිඵල සහ සාකච්ඡාව (Results and Discussion)

පර්යේෂණය සිදු කිරීම මඟින් සොයාගත් ප්‍රතිඵල විශ්ලේෂණය සිදු කිරීම තුළින් සාකච්ඡාව ගොඩනගගන්නේ මෙහිදී ය. පර්යේෂණයට අදාළ ප්‍රතිඵල පැහැදිලි කිරීම මෙන්ම ඍජු ලෙස කරුණු ඉදිරිපත් කළ හැකිය. පූර්ව පර්යේෂණ හා සමගාමී පර්යේෂණ සමඟ ස්වකීය පර්යේෂණමය ප්‍රතිඵල ඇගැයීම සිදු කළ හැකිය. සමාජීය වශයෙන් හා කාලීන වශයෙන් පර්යේෂණයේ ප්‍රතිඵල වැදගත් වන ආකාරය හා අවසන් නිගමනය විස්තර කළ යුතුය.

### 07. ප්‍රමුඛ පද (Key Words)

අවමය වචන තුනක් සහ උපරිම වචන පහක් ඉදිරිපත් කරන්න.

### 08. ආශ්‍රිත ග්‍රන්ථ (References)

Harward ක්‍රමයට විය යුතුය. පර්යේෂණයේ දී ඉතාම වැදගත් වූ මූලාශ්‍ර තුනක් පමණක් සඳහන් කරන්න.

### 09. පොදු කරුණු

- අන්තර්ගතය FMAbaya යොදන විට අක්ෂර වල ප්‍රමාණය (Font Size) 12 විය යුතුය.
- Times New Roman යොදන විට අක්ෂර ප්‍රමාණය (Font Size) 11 විය යුතුය.
- විද්‍යුත් තැපැල් ලිපිනය - ursaru@ssh.rjt.ac.lk
- පේළි අතර පරතරය (Line Space) 1.25 විය යුතුය.
- Page Size B5
- සමස්ථ පර්යේෂණ පත්‍රිකාවේ සංක්ෂිප්තයේ වචන ප්‍රමාණය 750 - 800 අතර විය යුතුය.
- PDF හා Word දෙආකාරයෙන් ම විස්තෘත පර්යේෂණ පත්‍රිකාව ලැබීමට සලස්වන්න.

**සැ.යු.**

- ආචාර්යවරයෙකුගේ නිර්දේශය මත යොමු කරන්නේ නම් ඔබගේ පර්යේෂණ පත්‍රිකාව සමුළුව සඳහා තෝරාගැනීමේ වැඩි ඉඩක් පවතී.
- ආචාර්යවරයෙකුගේ නිර්දේශය මත එවන්නේ නම් ලබා දී ඇති අයදුම් පත්‍රය සම්පූර්ණ කොට පත්‍රිකාව (Abstract) සමඟ එවිය යුතුය.
- කර්තෘගේ හෝ කර්තෘන්ගේ සම්පූර්ණ විස්තර එවා ඇති අයදුම්පතෙහි ආකාරයට එවිය යුතුය.
- යොදා ගන්නා තේමාව පිළිබඳව සඳහන් කළ යුතු වේ.
- එක් කර්තෘ කෙනෙකුට ඉදිරිපත් කළ හැකි උපරිම පර්යේෂණ පත්‍රිකා ප්‍රමාණය ද්විත්වයකි.
- සාමූහික පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා උපරිම කර්තෘවරු තිදෙනෙකුට පමණක් කර්තෘත්වය දැරිය හැක.
- පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන කර්තෘවරුන් ලියාපදිංචි වීම උදෙසා සිදු කළ යුතු ගෙවීම් පහත පරිදි වේ.
  - එක් පත්‍රිකාවක් සඳහා රු1500 ක් බැගින් ද ,
  - එක් කර්තෘ කෙනෙක් පත්‍රිකා දෙකක් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා රු3000 ක්

- සාමූහික පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නේනම් එක් අයකු රු1500 ක් බැගින් රු4500 ක් ද ගෙවීම් කළ යුතු වේ.

Page Size B5

Words 750 - 800

Marging 1 inch

**මිහින්තලේ කණ්ඨක චෛත්‍ය බිතුසිතුවම් හායනය වීමට බලපාන හායනකාරක පිළිබඳ අධ්‍යයනයක්**

FMabhaya, 14, bold, Line Sapce 1.5

1 Enter


**ඒ.එච් කරුණාරත්න**[1]

FMabhaya, 11, bold, Line Sapce 1.5

1 Enter

**පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,**

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.**

karunarathna27@gmail.com


FMabhaya, 11, bold,

Line Sapce 1.5

Email - Time New Roman

2 Enter

හැඳින්වීම

FMabhaya, 12

Marging 1 inch

Marging 1 inch

ක්‍රමවේදය

FMabhaya, 12

ප්‍රතිඵල හා සාකච්ඡාව

FMabhaya, 12

ප්‍රමුඛ පද

ආශ්‍රිත ග්‍රන්ථ

FMabhaya, 11

Marging 1 inch